# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1465/20 – 2006 ඔක්තෝබර් 05 වැනි බ්‍රහස්පතින්දා – 2006.10.05**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වැනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වගන්තිය සමග කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් ;

(අ) මෙහි උපලේඛනයේ දැක්වෙන සෑම සාධන පත්‍රයක්ම 2006.10.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුද්දර ගාස්තුවෙන් නිදහස් කරමි.

(ආ) එම වගන්තිය යටතේ පනවන ලද 2006 අප්‍රේල් 03 දිනැති සහ අංක 1439/2 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලදුව 2006 අප්‍රේල් මස 20 දිනැති අංක 1441/18 දරන *ගැසට් නිවේදනය* මගින් සංශෝධිත නියෝග, 2006.10.06 දින සිට බලපැවැත්වෙන පරිදි පරිච්ඡින්න කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2006 ඔක්තෝබර් මස 05 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

01 යම් රජයේ නිලධාරියෙකුගේ ඉල්ලීම මත හෝ යම් ලිඛිත නීතියක් යටතේ පනවන ලද යම් නියමයකට අනුකූලව ඉදිරිපත් කරන ලද දිවුරුම් පෙත්සමක් ;

02. සිය රාජකාරි නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යම් රාජ්‍ය නිලධාරියෙකු හෝ ඔහුගේ ඇපකරුවකු විසින් දෙන ලද බැඳුම්කරයක් හෝ උකසක් ;

03. 1982 අංක 43 දරන පනතේ 67(3) වගන්තිය යටතේ වන නියෝගය බලාත්මක වන යම් රටක රජයක් විසින් හෝ රජය වෙනුවෙන් හෝ රජය සඳහා ක්‍රියාත්මක කරන යම් සාධන පත්‍රයක් ;

04. ආහාර භෝග හෝ ස්වර්ණාභරණ උකස් කිරීම සඳහා වූ යම් සාධන පත්‍රයක් ;

;



05. නැති වූ හෝ විනාශ වූ කොටස් සහතික පත්‍රයක් වෙනුවට හෝ දැනට තිබෙන කොටස් සහතික වෙනුවට, එහෙත් දැනට තිබෙන කොටස් සහතිකවල වටිනාකම නොඉක්මවන, වැඩි හෝ අඩු කොටස් සංඛ්‍යාවක් සඳහා නිකුත් කරන ලද අළුත් කොටස් සහතිකයක් ;

06. යම් කොටසක් එක් තැනැත්තකු විසින් විකිණීම සහ තවත් තැනැත්තකු විසින් මිළයට ගැනීමට ආනුශංගිකව නිකුත් කරනු ලැබූ යම් කොටස් සහතිකයක්; එම විකිණීම හා මිලට ගැනීමට අදාලව, 2005 අංක 5 දරන මුදල් පනතේ II කොටස යටතේ කොටස් ගණුදෙනු බද්ද අය කරනු ලැබ ඇත්නම් ;

07. 1990 අංක 18 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ යම් කොටසක් නිකුත් කිරීම, මාරු කිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් වන යම් කොටස් සහතිකයක් ;

08. 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක කරන ලද යම් සාධන පත්‍රයක් ;

09. 1972 අංක 05 දරන සමුපකාර සමිති නීතියේ අර්ථය තුළ ලියාපදිංචි සමුපකාර සමිතියක් විසින් හෝ එම සංගමය වෙනුවෙන් හෝ එම සංගමය සඳහා ක්‍රියාත්මක කරන ලද යම් සාධන පත්‍රයක් ;

10. 1972 අංක 05 දරන සමුපකාර සමිති නීතියේ අර්ථය තුළ ලියාපදිංචි සමුපකාර සමිතියක සාමාජිකයෙකු විසින්, එවැනි ලියාපදිංචි සමිතියක ව්‍යාපාර කටයුතු සඳහා සහ ඊට අදාළව ක්‍රියාත්මක කරන ලද යම් සාධන පත්‍රයක් ;

11. අන්‍යොන්‍ය ප්‍රතිලාභ ශ්‍රී ලංකාවේ අනුරූපී දූත මණ්ඩලවලට ලැබෙන්නේ නම්, යම් රාජ්‍යයක. රාජතාන්ත්‍රික දූත මණ්ඩලයකට හෝ 1996 අංක 09 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන්නා වූ යම් සංවිධානයකට, සපයන ලද යම් භාණ්ඩයක් හෝ සේවාවක් වෙනුවෙන් යම් සාධන පත්‍රයක් ;

12. (අ) ජීවිත හෝ වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් ; හෝ

(ආ) (i) සිවිල් ඉදිකිරීම් කර්මාන්තයේ දී හෝ කෘෂිකර්මාන්තයේ දී යොදාගන්නා පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ; හෝ

(ii) ගමන් බිමන් සඳහා යොදා ගන්නා වාහන හැර අනෙකුත් වාහන; හෝ සම්බන්ධයෙන් වන රක්ෂණ ඔප්පුවක් ;

13. 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරි පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ගුවන් යානයක් හෝ 1971 අංක 52 දරන වෙළෙඳ නාවික පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් නැවක් සම්බන්ධයෙන් වන උකස් ඔප්පුවක් ;

14. 1988 අංක 30 දරන බැංකු පනත යටතේ මුදල් මණ්ඩලය වෙතින් බලපත්‍රලත් යම් වාණිජ හෝ විශේෂිත බැංකුවක්, 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි යම් මූල්‍ය සමාගමක්, 1972 අංක 5 දරන සමුපකාර සමිති නීතිය යටතේ ලියාපදිංචි ආයතනයක්, යම් රාජ්‍ය සංස්ථාවක්, 2006 අංක 10 හෝ 2000 අංක 38 හෝ 1979 අංක 28 හෝ 1963 අංක 04 දරන දේශීය ආදායම් පනතේ කටයුතු සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථ සාධක අරමුදලක්, හෝ නිවාස විෂය භාර ඇමතිවරයා විසින් අනුමත යම් ආයතනයක් උකස් හිමියා වන අවස්ථාවන්හිදී,

(අ) නිවසක් ඉදිකිරීම; හෝ

(ආ) නිවසක් හෝ නිවසක් ඉදිකිරීම සඳහා බිම් කොටසක් මිළට ගැනීම

සඳහා ලබාගන්නා ලද රුපියල් 30,00,000ක් හෝ ඊට අඩු ණය මුදලක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද උකස් ඔප්පුවක් ;

15. ගමන් බිමන් සඳහා යොදා ගන්නා මෝටර් වාහන සම්බන්ධයෙන් වන මූල්‍ය කල් බදු ගිවිසුමක් හැර, යම් දේපළක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද මූල්‍ය කල් බදු ගිවිසුමක් ;

16. ගමන් බිමන් සඳහා යොදා ගන්නා මෝටර් වාහන හැර යම් චංචල දේපලක් සම්බන්ධයෙන් 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ ඇති කරගත් යම් කුළී සින්නක්කර ගිවිසුමක් ;

17. ගොඩනැල්ලක් වෙනුවෙන් මසකට ගෙවිය යුතු බදු කුලී හෝ කුළි වාරිකය රුපියල් 5,000 නොඉක්මවන, බද්දට හෝ කුලියට දීමට සම්බන්ධවන යම් සාධන පත්‍රයක් ;

18. යම් සේවා යෝජකයකු විසින් ඔහුගේ සේවා නියුක්තිකයකු වෙත ගෙවනු ලබන රුපියල් 25,000 නො ඉක්මවන පාරිශ්‍රමිකය සඳහා ; හෝ රුපියල් 1,000 කට අඩු යම් මුදලක් හෝ වෙනත් දේපලක් සඳහා, දෙන ලද ලදුපතක් හෝ නිදහස් කිරීමක් ;

19. 1988 අංක 78 දරන මුල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි යම් මුල්‍ය සමාගමක හෝ, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ මුදල් මණ්ඩලය වෙතින් බලපත්‍රලත් යම් වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක, හෝ 1972 අංක 5 දරන සමුපකාර සමිති නීතිය යටතේ ලියාපදිංචි ආයතනයක හෝ මුදල් තැන්පත් කිරීමේ දී හෝ මුදල් ආපසු ගැනීමේදී දෙන ලද ලදුපතක් ;

20. මෙම නිදහස් කිරීම නොවේ නම්, අයකළ යුතු බද්ද ගෙවීමට ආණ්ඩුව යටත් විය යුතු අවස්ථාවලදී, ආණ්ඩුව විසින් හෝ අණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ වාසියට ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් ;

21. විකුණන ලද යම් භාණ්ඩයක් හෝ සපයන ලද සේවාවන් වෙනුවෙන් එවැනි විකිණීමක් හෝ සැපයීමක් කළ වහාම මුදල් ලබන යම් තැනැත්තෙකු විසින් දෙන ලද යම් ලදුපතක් ;

22. මරණ පාරිතෝෂිකයක් වශයෙන් හෝ මරණය හෝ තුවාල සිදුවීම සම්බන්ධයෙන් වන්දි වශයෙන් ප්‍රාග්ධන මුදලක ආකාරයෙන් ලබන මුදලක් සඳහා දෙනු ලබන යම් ලදුපතක් ;

23. විශ්‍රාම වැටුප ලැබීමේ දී දෙනු ලබන යම් ලදුපතක් ;

24. යම් වාණිජපත් හෝ ණයකර ;

25. ප්‍රතිශ්ඨාවක් නොලැබෙන අවස්ථාවන්හිදී ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව සඳහා හෝ වෙනුවෙන් වෙනත් යම් තැනැත්තෙකු විසින් හෝ කරන සමර්පණය කිරීමක් හෝ පැවරීමක් ;

26. අධිකරණ කටයුතුවලදී ඉදිරිපත් කරනු ලබන පහත සඳහන් ලේඛණ:

(අ) යම් අධිකරණයක යම් නඩු කටයුතුවල දී නිල බලයෙන් නඩු පවරන හෝ නඩු පවරනු ලබන හෝ මැදිහත් වන රජයේ නිලධරයන් විසින් ඒ අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛන ;

(ආ) යම් අධිකරණයක නඩු පවරනු ලැබූ යම් නඩු කටයුතුවල දී දිළින්දෙකු වශයෙන් නඩු පැවරීමට විත්ති වාචක ඉදිරිපත් කිරීමට හෝ මැදිහත්වීමට යථා පරිදි ඉඩ දෙන ලද යම් තැනැත්තෙකු විසින් එම අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛන;

(ඇ) තමා බුන්වත් තැනැත්තෙකු ලෙස ප්‍රකාශයට පමුණුවන ලෙස යම් අධිකරණයකින් ඉල්ලමින් යම් තැනැත්තෙකු විසින් එම අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛන ;

(ඈ) හබෙයාස් කෝපුස් රිට් ආඥාවක් සඳහා කරනු ලබන ඉල්ලීමක කාර්යය පිණිස යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන ලේඛන ;

(ඉ) 1978 අංක 27 දරන නීති ආධාර පනත යටතේ සපයන ලද නීති ආධාර උපයෝගී කර ගනිමින් නඩු පවරනු ලබන, විත්ති වාචකය කරනු ලබන හෝ මැදිහත් වනු ලබන තැනැත්තෙකු ලෙස නියමිත නිලධරයෙකු විසින් සහතික කරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් හෝ වෙනුවෙන් ගොනු කරනු ලබන සියළු ලේඛන ;

(ඊ) මෝටර් වාහනයකින් සිදු වූ මරණයකින් හෝ හානියකින් හට ගන්නා යම් අලාභයක් ඉල්ලුම් කරන යම් තැනැත්තෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් අධිකරණයකට ඉදිරිපත් කරන ලබන ලේඛන ;

(උ) යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන මෝසම් ;

(ඌ) ඉල්ලීමක් මත හෝ සිය මෙහෙයවීමෙන්ම හෝ යම් අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන වරෙන්තු.

10–489

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.